පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 13 |

# අවසාන වාර පරීක්ෂණය - 2024

## කෘෂි විද්‍යාව 08 S I කොටස

පාසලේ නම : ..................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02යි.

**උපදෙස්:-** 1- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2- ප්‍රශ්න අංක 01 සිට 50 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරා එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන පරිදි කතිරයක් (X) යොදා සළකුණු කරන්න.

1) වී හැර බඩඉරිඟු, කඩල වැනි අනෙකුත් ආහාර භෝග (ක්ෂේත්‍ර) සඳහා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇති ප්‍රදේශ වන්නේ,
(1) බතලගොඩ, මහඉලුප්පල්ලම (2) අගලවත්ත, ගන්නෝරුව (3) මහඉලුප්පල්ලම,ගන්නෝරුව වේ
(4) කඹුරුපිටිය, ගන්නෝරුව (5) අඟුණකොලපැලැස්ස, මහඉලුප්පල්ලම

2) අතීත ශ්‍රී ලංකාවේ පැවති කෘෂිකාර්මික සශ්‍රීකත්වයට බලපා නොමැති හේතුව කුමක්ද?
(1) දේශීය තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතා කිරීම
(2) රාජ්‍ය අනුග්‍රහය නිබඳව ලැබීම
(3) ආහාරමය ද්‍රව්‍ය අපනයනය මගින් රෙදිපිළි ආදී සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගැනීමට ජනයා පෙළඹීම
(4) බුදු දහම මගින් ආහාරමය භෝග වගාව සඳහා ලැබුණු පිටුවහල
(5) ජල කළමණාකරණය සඳහා රජයෙන් ලැබුණු සහයෝගය

3) දීප්ත සූර්යාලෝක පැය ගණන මැනීමට භාවිතා කරන උපකරණය කුමක්ද? ,
(1) සූර්ය විකිරණ මානය (2) Camphbell සූර්ය දීප්තිමානය
(3) සූර්ය කැල්කියුලේටයරය (4) ෆයිරිනෝමීටරය
(5) සූර්ය වර්ණාවලීක්ෂය

4) තෙත් කලාපය පිළිබඳ අධ්‍යනය කළ ශිෂ්‍ය කණ්ඩායමක් රැස්කල තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
A – තෙත් කලාපයේ වාර්ෂික වර්ෂාපතනය මි. මී. 2500 කි.
B – වැඩිපුරම වර්ෂාපතනය ලැබෙනුයේ නිරිත දිග මෝසම් වර්ෂාව මඟිනි.
C - තෙත් කලාපයේ දීර්ඝ වර්ෂාපතන කාල දක්නට නොලැබේ.
ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා C පමණි. (5) B හා C පමණි.

5) යම්කිසි පසක pH අගය 5 ක් වී නම් එම පස පිළිබඳව නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) මෙම පසෙහි $Fe^{+3}$, $Mn^{+2}$ අයන බහුලව හමුවිය හැකිය.
(2) මෙම පස ඉතා අධික ආම්ලික පසකි.
(3) මෙම පසෙහි වගා කරන ශාකවලට නයිට්‍රජන් ඌන විය හැකි නමුත් පොස්පරස් විෂ විය හැකිය.
(4) තේ වගාව අසාර්ථක වන නමුත් උඩරට එළවළු වගාවන් සාර්ථක වේ.
(5) මෙම පස භූමි භාවිත වර්ගීකරණයට අනුව ප්‍රයෝජනයට ගනු ලබන පසකි.

6) පාංශු සංස්ථිතිය පසක වැදගත් ගුණාංගයකි. පසේ තදබව අඩුකළ හැක්කේ,
(1) පාංශු ව්‍යුහය හා වාතනය දියුණු කිරීමෙම් හා පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙනි.
(2) දෘෂ්‍ය ඝනත්වය අඩුකොට හා පසට රසායනික පොහොර එකතු කිරීමෙනි .
(3) පසේ අංශු ඝනත්වය වැඩි කොට හා පසට ඩොලමයිට් එකතු කිරීමෙනි.
(4) පසේ සත්‍ය ඝනත්වය අඩු කොට හා පසට රසායනික පොහොර හා ඩොලමයිට් එකතු කිරීමෙනි.
(5) පස කන්න 2 -3 වගා නොකර අතහැර දැමීමෙන් පසුව භූමිය පිළිස්සීමෙනි.

7) පසේ ක්ෂාරීයතාවය හා ලවණතාවය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න,

(1) ක්ෂාරීයතාවයේදී පාංශු ද්‍රාවණයේ දියවී ඇති ලවණ සාන්ද්‍රණය සාපේක්ෂව අඩු නමුත් ලවණතාවයේදී පාංශු ද්‍රාවණයේ දියවී ඇති ලවණ සාන්ද්‍රණය සාපේක්ෂව අධිකය.

(2) ක්ෂාරීයතාවයේදී pH අගය 8.5 ට වඩා වැඩි නමුත් ලවණතාවයේදී pH අගය 8.5 – 7.5 අතර වේ.

(3) ක්ෂාරීයතාවයේදී විද්‍යුත් සන්නායකතවය 4 milisemens/cm ට වඩා අඩු නමුත් ලවණතාවයේදී විද්‍යුත් සන්නායකතාවය 4 milisemens/cm වඩා වැඩිය.

(4) ක්ෂාරීයතාවයේදී කලිල සංකීර්ණයේ හුවමාරුවිය හැකි $Na^+$ ප්‍රතිශතය 15% ට අඩු නමුත් ලවණතාවයේදී හුවමාරුවිය හැකි ප්‍රතිශතය 15% ට වැඩිය.

(5) ක්ෂාරීයතාවයේදී ලවණතාවයේදී පාංශු ද්‍රාවණයේ $Na^+$ සාන්ද්‍රණය අඩු නමුත් පාංශු ද්‍රාවණයේ $Na^+$ සාන්ද්‍රණය වැඩිය.

8) ශාක පත්‍රවල ඇන්තොසයනික් වර්ණකය වර්ධනය වීම, පත්‍ර ඝනකම් වීම දක්නට ලැබෙන්නේ කුමන පෝෂකයක් ඌන වූ විටද?

(1) N ඌනතාවය හේතුවෙනි. (2) P ඌනතාවය හේතුවෙනි. (3) Zn ඌනතාවය හේතුවෙනි.
(4) Mg ඌනතාවය හේතුවෙනි. (5) Ca ඌනතාවය හේතුවෙනි.

9) කොම්පෝස්ට් පොහොර සෑදීමට යොදා ගන්නා කාබනික ද්‍රව්‍ය,

(1) C/N අනුපාතය වැඩි කාබනික ද්‍රව්‍ය ඉක්මනින් ජීර්ණය වෙයි.
(2) C/N අනුපාතය වැඩි කාබනික ද්‍රව්‍ය ජීර්ණය නොවේ.
(3) C/N අනුපාතය අඩු කාබනික ද්‍රව්‍ය සෙමෙන් ජීර්ණය වේ.
(4) C/N අනුපාතය වැඩි කාබනික ද්‍රව්‍ය සහ අඩු කාබනික ද්‍රව්‍ය එකට මිශ්‍ර කර කොම්පෝස්ට් සෑදීමෙන් වඩාත් ඵලදායි කොම්පොස්ට් නිෂ්පාදනය කළ හැක.
(5) වේගවත් කොම්පෝස්ට් නිෂ්පාදනයක් සඳහා C/N අනුපාතය වැඩි කාබනික ද්‍රව්‍ය කොම්පෝස්ට් ගොඩ සෑදීමේදී එකතු කළ යුතුය.

10) බිම් සැකසීමේ උපකරණ කිහිපයක් පහත දැක්වේ.

(A) හැඩලැලි නගුල (B) උදැල්ල (C) තැටි පෝරුව (D) කොකු නගුල

ඉහත ඒවායින් ප්‍රාථමික බිම් සැකසීම සිදුකරන්නේ,

(1) A මගින් පමනි. (2) C මගින් පමණි . (3) A හා B මගින්. (4) A හා D මගින්. (5) B හා D මගිනි.

11) වියලි කලාපයේ බෑවුම් සහිත බිමක් හිමි ගොවියෙකුට එහි විශාල බීජ සහිත බෝගයක් සිටුවීමට අවශ්‍යව ඇත. ඔහුගේ ක්ෂේත්‍රය සඳහා වඩාත් උචිත බිම් සැකසීම වනුයේ,

(1) තැටි නඟුලෙන් සී සෑමය (2) පෝරු ගෑමය. (3) මඩ කිරීමය.
4) ශුන්‍ය බිම් සැකසීමය. (5) අවම බිම් සැකසීමය.

12) දෛනික වාෂ්පීකරණ උත්ස්වේදනය මිලි මීටර 14 ක් වූ ප්‍රදේශයක පිහිටි හෙක්ටයාර 1 ක වගා බිමකට සැපයිය යුතු අවම දෛනික ජල පරිමාව

(1) $0.14\ m^3$ (2) $14\ m^3$ (3) $140m^3$ (4) $0.7m^3$ (5) $70m^3$

13) දුර්වල ජලවහනය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල අඩංගු නොවන පිළිතුර මින් කුමක්ද?

(1) පාංශු වාතනය දුර්වල වීම, පාංශු ව්‍යුහය බිඳ වැටීම (2) පාංශු ව්‍යුහය දුර්වල වීම, පස ආම්ලික වීම
(3) පස ආම්ලික විම, පාංශු ව්‍යුහය බිඳ වැටීම (4) පාංශු වාතය දුර්වල වීම, මුල්රෝග ව්‍යාප්තවීම
(5) පස ආම්ලික විම, ක්ෂුද්‍රජීවී ක්‍රියා අඩපන විම

14) උත්ස්වේදනය හා වාෂ්පීකරණය අතර වෙනස්කම පැහැදිළිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) උත්ස්වේදනය ජෛව විද්‍යාත්මක ක්‍රියාවලියකි. වාෂ්පීකරණය කායික විද්‍යාත්මක ක්‍රියාවලියකි.
(2) උත්ස්වේදනය කායික විද්‍යාත්මක ක්‍රියාවලියකි. වාෂ්පීකරණය භෞතික සංසිද්ධියකි.
(3) උත්සවේදනයේ දී මතුපිට වියැලෙන අතර වාෂ්පීකරණයේදී මතුපිට සිසිල් වේ.
(4) උත්සවේදනය පූටිකා පාලක සෛල මගින් යාමනය වන අතර වාෂ්පීකරණය ජල ජිද්‍ර මගින් යාමනය වේ.
(5) උත්ස්වේදනය ශාක මතින් සිදුවන අතරින් වාෂ්පීකරණය පත්‍ර මතින් සිදුවේ.

15) පහත රූප සටහනට අනුව A ලෙස ක්‍රියාකාරීවන හෝර්මෝනය විය හැක්කේ කුමක්ද?




(1) ඔක්සීන් (2) ගිබරලින්
(3) සයිටොකයිනීන් (4) එතිලීන්
(5) ඇබ්සිසික් අම්ලය

16) පරපරාගනයට අනුවර්තනය වනුයේ,

A- විවෘත නොවූ පුෂ්ප B- ස්ව අසංගතිය C- ඒකලිංගික පුෂ්ප D අසම පරිනතිය
E- ස්ව වන්ධ්‍යතාවය

(1) A, B හා Cපමණි. (2) B, C හා D පමණි. (3) A, B, C හා D පමණි.
(4) B, C, D, හා E පමණි. (5) සියල්ල නිවැරදිය.

17) බොහෝ බීජ වර්ග ප්‍රරෝහණය කරගැනීමේ දී පොගවා, බීජ ගොඩගසා ආවරණය කර තැබීම සිදු කරයි. මින් බලාපොරොත්තු වන්නේ,

(1) ගොඩතුළ උෂ්ණත්වය වැඩිකර ප්‍රරෝහණය වීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම
(2) ගොඩතුළ $O_2$ සාන්ද්‍රණය වැඩිකර බීජ ප්‍රරෝහණය වේගවත් කිරීම
(3) බීජවල එන්සයිම උත්ප්‍රේරණය කර, ගොඩතුළ උෂ්ණත්වය වැඩිකර බීජ ප්‍රරෝහණය වේගවත් කිරීම
(4) ගොඩතුළට ලැබෙන ආලෝකය අඩුකර, O2 සාන්ද්‍රණය වැඩිකර බීජ ප්‍රරෝහණය වේගවත් කිරීම
(5) ශ්වසන ක්‍රියාවලිය යාමනය කර, O2 සාන්ද්‍රණය වැඩිකර බීජ ප්‍රරෝහණය ඉක්මන් කිරීම

18) ශාක කැබලිවල මුල් ඇද්දවීම සූර්ය ප්‍රචාරක තුළදි ඉක්මනින් සිදුවන්නේ එම ව්‍යුහ තුළ,

(1) අර්ධ සෙවන හා ඉහළ උෂ්ණත්වය නිසා හෝර්මෝන ක්‍රියාකාරීත්වය හා කායික ක්‍රියා වේගවත් වීම නිසාය.
(2) ඉහළ ආර්ද්‍රතාවයක් හා උෂ්ණත්වයක් තිබිම නිසා හෝර්මෝන ක්‍රියාකාරීත්වය හා කායික ක්‍රියා වේගවත් වීම නිසාය.
(3) වාතයේ CO2සාන්ද්‍රණය ඉහළයාම හා ඉහළ ආර්ද්‍රතාව නිසා ප්‍රභාසංස්ලේෂණය වේගවත් වීම නිසාය.
(4) රෝග හා පලිබෝධ වලින් ආරක්ෂාවීම නිසාය
(5) ඉහළ උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාවය නිසා ප්‍රභාසංස්ලේෂණය වේගවත් වීම නිසාය.

19) පහත භූගත කඳන් අතරින් කෝමයක් , රෛසෝමයක් හා බල්බයක් වන්නේ පිළිවෙලින්,

(1) ලීක්ස් , කෙසෙල් හා අර්තාපල් ය. (2) කෙසෙල් , අර්තාපල් හා ලීක්ස් ය.
(3) ඉන්නල , ලූණු හා ලීක්ස් ය. (4) කිරිඅල , ඉගුරු හා ලූණු ය.
(5) කිරිඅල , ඉගුරු හා හබරල ය.

20) පටක රෝපණයේදී සුක්රෝස් භාවිතා කරන්නේ පටක රෝපණ මාධ්‍යයක අඩංගු විය යුතු කුමන ද්‍රව්‍යයක් ලෙසද?

(1) වෙනත් ආකලන ද්‍රව්‍යයක් හා කාබන් ප්‍රභවයක් ලෙසිනි.
(2) කාබන් සහ ශක්ති ප්‍රභවයක් ලෙසිනි.
(3) ජෙල් කාරකයක් හා වර්ධක යාමකයක් ලෙසිනි.
(4) වර්ධක යාමකයක් හා ශක්ති ප්‍රභවයක් ලෙසිනි.
(5) අකාබනික පෝෂක හා අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ප්‍රභවයක් ලෙසිනි.

21) ශාකවල ප්‍රවේණික විචලතායක් ඇතිකිරීමට දැනට වඩාත් වැඩිපුර භාවිතා කරන ජනප්‍රිය තාක්ෂණය ලෙස සැලකිය හැක්කේ,

(1) වරණය (2) ජාන තාක්‍ෂණය (3) ජෛව තාක්‍ෂණය (4) විකෘති අභිජනනය (5) දෙමුහුම්කිරීම

22) ජාන සම්පත් සංරක්ෂණය වැදගත් වේ. එසේ නමුත් ජාන සම්පත් සංරක්ෂණයේ අත්‍යවශ්‍ය කාරණාවක් නොවන සෑම විටම අවශ්‍ය නොවන වැදගත්කමක් ලෙසස ැලිකය හැකි පිළිතුර කුමක්ද?

(1) ජාන කිට්ටුව තුළ ප්‍රවේණික විවිධත්වය රැක ගැනීම
(2) අහඹුව බිහි වන නව ප්‍රභේද (විකෘති) රැක ගැනීම
(3) එමගින් පරිසරය තුළ ජාන තුලිතතාව රැක ගැනීම
(4) අනාගත අවශ්‍යතා සඳහා ශාක අභිජනන කිරීමේ දී අවශ්‍ය වන උසස් ගතිගුණ සහිත ජාන ආරක්ෂා කිරීම
(5) ජාන ඉන්ජිනේරු විද්‍යාවේ තාක්ෂණික කටයුතු සඳහා අමු ද්‍රව්‍ය සැපයීම

23) පහත දැක්වෙන ආරක්ෂිත ගෘහ තුල භෝග වගාවට අදාළ ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පාලිත ගෘහතුළ අකලට වුවද වගාකළ හැකිය. නමුත් භෝගවල කායික වෙනස්කම් රාශියක් ඇතිවේ.
(2) වර්තමානයේ ලංකාවේ පහත රට ප්‍රදේශවල බහුලව දැකිය හැකි පාලිත ගෘහය පොලිතීන් උමංය.
(3) පාලිත ගෘහතුළ වවන බෝග වල අස්වැන්න ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවින් ඉහළය.
(4) පාලිත ගෘහතුළ වායුගෝලීය වායු සංයුතිය පිටත වායුගෝලීය සංයුතියට වඩා බොහෝ සේ වෙනස්ය.
(5) සැම පාලිත ගෘහ තුළම උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය වැඩි අගයක් ගනී.

24) තාවකාලික පාලිත ව්‍යුහ භාවිතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න
(1) බෝග වල විවිධ වර්ධන අවධි කාල පරිච්ඡේදවලදී පරිසරය පාලනය කිරීමට ය.
(2) බෝගයක පර පරාගනය සඳහා පුෂ්පීකරණ අවධියේ සුළඟේ ප්‍රවේගය පාලනය කිරීමට ය.
(3) බෝගයේ වර්ධක අවධියේ හෝ පරිනත අවධියේදී අධික ආර්ද්‍රතාවක් සැපයීමට ය.
(4) බෝගයේ අස්වනු නෙලන අවධියේ දී පරිසරය පාලනය කිරීමට ය.
(5) බෝගයේ ප්‍රජනක අවධියේ දී උෂ්ණත්වය පාලනය කිරීමට ය.

25) මෙම රූප සටහනේ දැක්වෙන නිර්පාංශු වගා ක්‍රමය කුමක්ද?
(1) නොගැඹුරු පෝෂණ ද්‍රාවණ පටල තාක්ෂණය
(2) ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය
(3) මුල් ගිල් වූ වගාව
(4) පා වෙන වගාව
(5) කේශික අවශෝෂණ වගාව




26) සාර්ථක වල්පැළෑටි පාලන වැඩ සටහනකට අවශ්‍ය ක්‍රියාකාරකම් පහත දැක්වේ.
A- වල්පැළෑටි හඳුනාගැනීම සහ ඒවායේ ජීවන චක්‍ර අවබෝධ කර ගැනීම
B - පාත්ති නිසිලෙස සකස් කර ගැනිම
C- අතිරේක ශ්‍රමය යොදා වල් පැළ ගලවා ඉවත් කිරිම
D - අඛන්ඩව වල්නාශක යෙදිම
E- වල පැළ විනාශ වන තෙක් ජලයෙන් යට කිරීම
ඉහත ක්‍රියා මාර්ග අතරින් ශෂ්‍ය ක්‍රම ලෙස සැලකිය හැකි ක්‍රම අඩංගු පිළිතුර තෝරන්න
(1) A පමණි. (2) A හා B පමණි. (3) B, C හා D පමණි.
(4) B, C,හා E පමණි. (5) A, B, C හා E පමණි.

- 27, 28 ප්‍රශ්න සඳහා පහත දැක්වෙන කෘමින් පලිබෝධ පදනම්කර ගෙන පිළිතුරු සපයන්න.

A. පැල මැක්කා B. දුඹුරු පැල කීඩෑවා C. එපිලැක්නා
D. පළතුරු මැස්සා E. ගොයම් මකුණා

27) පූර්ණ රූපාන්තරණයක් සහිත කෘමීන් අඩංගු පිළිතුර වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) C හා D පමණි. (5) D හා E පමණි.

28) විද යුෂ උරාබොන මුඛ උපාංග ඇති කෘමින් වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) C හා D පමණි. (5) D හා E පමණි.

29) කාබනික පොස්පරස් සංයෝග පළිබෝධක නාශකවලට වඩා කෘත්‍රිම පයිරෙත්‍රොයිඩ පළිබෝධනාශක ජනප්‍රිය වී ඇත්තේ කෘත්‍රිම පයිරෙත්‍රොයිඩ යනු,
(1) යෙදීමට පහසු නිසාය. (2) ස්වභාවික සතුරන් නොමරන නිසාය.
(3) අර්ධ ජීව කාලය කෙටි පළිබෝධනාශකයක් නිසාය.
(4) ගොවිපොළ සේවකයාට ඇතිකරන බලපෑම අඩු පළිබෝධනාශකයක් නිසාය.
(5) ඉහත සඳහන් සියල්ලම නිවැරදිය.

30) ආහාර විෂවීම ඇතිකරනු ලබන ප්‍රධාන කාරක ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) ආහාරයේ ඇති විෂ රසායනික හා අපද්‍රව්‍ය මගිනි.
(2) ක්ෂුද්‍ර ජීවීන් හා ආහාරයේ ඇති විෂ රසායනික මගිනි.
(3) ආහාරයේ ක්ෂුද්‍ර ඛනිජ හා ක්ෂුද්‍ර ජීවීන් මගිනි.
(4) ආහාරයේ මහා පෝෂක හා ක්ෂුද්‍ර ජීවීන් මගිනි.
(5) එන්සයිම ක්‍රියාකාරීත්වය හා කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රවීම මගිනි.

31) ආහාර සැකසුම් කර්මාන්තයේදී පලතුරු නිෂ්පාදන ප්‍රමුඛ ස්ථානයක් ගනියි. පලතුරු සැකසීමේ දී සීනි සහ පැණි එකතු කිරීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,
(1) ජල විභවය වැඩිකිරීම සහ ක්ෂුද්‍ර ජීවීන් මර්දනය කිරීමයි.
(2) ජල රඳා සිටීමේ ධාරිතාව වැඩිකිරීම සහ වයනය දියුණු කිරීමයි.
(3) රසය වැඩිකිරීම සහ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය අවම කිරීමයි.
(4) විජලනය කිරීම සහ එන්සයිම අක්‍රිය කිරීමයි.
(5) රසය වැඩිකිරීම සහ වර්ණය දියුණු කිරීමයි.

32) ආහාරයක අඩංගු වර්ණක හඳුනාගැනිමට E ශ්‍රේණිගත අංකයක් ආහාර ඇසුරුමේ ලේබලයේ ප්‍රදර්ශනය කළ යුතුය. ඒ අනුව වර්ණක හඳුනාගත හැකි E ශ්‍රේණිගත අංකය වනුයේ,
(1) E 100-150 දක්වා (2) E 100-180 දක්වා (3) E 100-200 දක්වා
(4) E 100-250 දක්වා (5) E 100-300 දක්වා

33) එළවළු සහ පලතුරුවල පසු අස්වනු හානිය පිළිබඳව වඩාත් නිවැරදි වගන්තිය තෝරන්න.
(1) ගොවීන්ට සහනාධාර ලබාදීමෙන් එළවළු සහ පලතුරුවල පසු අස්වනු හානිය අවමකරගත හැකිය.
(2) පසු අස්වනු හානි වලට ප්‍රධානතම හේතුව අධික ලෙස පොහොර යෙදීම වැනි පෙර අස්වනු ක්‍රියාකාරකම්ය.
(3) ප්‍රවාහනයේ දී සිදුවන පසු අස්වනු හානිය අඩු කළ නොහැකිය. එම පසු අස්වනු හානි ප්‍රතිශතය නියතව පවතී.
(4) පෙර අස්වනු සාධක නිසි පරිදි හැසිරවීමෙන් පසු අස්වනු හානි නැති කරගත හැකිය.
(5) පසු අස්වනු හානියට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ නොදැනුවත්භාවය, අයෝග්‍ය හැසිරවීම, ඇසිරීම සහ ප්‍රවාහනයයි.

34) වී නිෂ්පාදනයේදී පසු අස්වනු හානි අඩු කර ගැනීම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වගාවේ වී කරල් වලින් 90% ක් රන්වන් පැහැ වූ අස්වනු නෙලීම
(2) නෙලා පිරිසිදු කරගත් වී අස්වනු තෙතමනය 12-13% දක්වා වියළා ගැනීමෙන් පසු ගබඩා කිරීම
(3) ගොයම පැහැදිලි කාලගුණයක් ඇති දිනයක කපා, අස්වනු වෙන් කර ගැනීම
(4) වැසිකාලයක දී නම් ගොයම් ගොඩගැසීම සහ පෑගීම සඳහා තාවකාලික මඩුවක් තුළ සිදු කිරීම
(5) උසස් වගා තත්ත්ව අනුගමනය කරමින් නියමිත පරතරයට පැළසිටුවීම සහ නිර්දේශිත පොහොර වර්ග යෙදීම

35) ගොවිපල සතුන්ගේ සාන්ද්‍ර ආහාර මිශ්‍රණවල ප්‍රෝටීන් පරිපූරක ලෙස යොදාගත හැකි ද්‍රව්‍ය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) බඩ ඉරිඟු, සහල් නිවුඩු, මොලැසස් හා කැඩුනු සහල්
(2) සෝයා බෝංචි අන්නය, සහල් නිවුඩු, පොල්පුනක්කු හා තිරිඟු නිවුඩු
(3) කරවල කුඩු, සෝයාබෝංචි අන්නය, කිරිපිටි හා තිරිඟු නිවුඩු
(4) කරවල කුඩු, සෝයාබෝංචි අන්නය, යොදය ඉවත්කළ කිරි පිටි හා පොල් පුන්නක්කු
(5) කටුපොල් මද තෙල් අන්නය, සහල් නිවුඩු, මොලෑසස් බඩඉරිඟු හා පොල්පුන්නක්කු

36) සරල ආහාර මාර්ගයක් සහිත කුකුළාගේ ආහාර ජීර්ණය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) චාර්වකයේ ආහාර යාන්ත්‍රික ජීර්ණයක් සිදුවේ.
(2) පූර්ව ආමාශයේ දී මෝල්ටේස් එන්සයිම ස්‍රාවය වේ.
(3) බේටයේ ඇති ඇමයිලෝස් එන්සයිම මගින් ගොපුර තුලදි ජීර්ණය සුලු වශයෙන් සිදුවේ.
(4) ග්‍රහනියේ දී හා කුඩා අන්ත්‍රයේ දී පිෂ්ඨය ග්ලූකෝස් බවට පත්වේ.
(5) ආහාරයේ ඇති ප්‍රෝටීන් ග්‍රහනියේ දී ට්‍රිප්සින් මගින් ඇමයිනෝ අම්ල බවට පත්වේ.

- ගවයන්ට වැළඳෙන රෝග කිහිපයක් පහත දැක්වේ. 37 හා 38 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට යොදා ගන්න.

A. බෘසෙල්ලොසිස් B. මැස්ටයිටිස් C. කිරි උණ
D. කුර හා මුඛ රෝගය E. බඩ පිපුම

37) ඉහත රෝග අතරින් බැක්ටීරියා මඟින් වැළඳෙන රෝග වන්නේ,
(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A, B හා Dපමණි.
(4) B, C හා D පමණි. (5) C, D හා E පමණි.

38) ඉහත රෝග අතරින් ආසාධිත රෝග වන්නේ,

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A, B හා D පමණි. (4) B, C හා D පමණි. (5) C, D හා E පමණි.

39) ගහනයක නුසුදුසු ලක්ෂණ සහිත සතුන් ඉවත්කර සුදුසු ලක්ෂණ සහිත සතුන් ගහනයේ රඳවා ගැනීම සඳහා ක්‍රියාත්මකවන අභිජනන ක්‍රමය තෝරන්න.

(1) දෙමුහුම් කිරීම (2) සහාභිජනනය (3) විකෘති ජනනය (4) අන්තරාභිජනනය (5) වරණය

40) කෘතිම සිංචනයේදී පට්ටි ගොනුන්ගෙන් ශුක්‍රාණු එකතු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේදී භාවිතා කරන ප්‍රධාන ක්‍රමය කුමක්ද?

(1) දෙනගේ යෝනිය භාවිතා කිරීම
(2) කෘතීම යෝනිය භාවිතා කිරීම
(3) විද්‍යුත් විසර්ජක භාවිතා කිරීම
(4) ශිෂ්නය පිරි මැදීම
(5) චූෂණ නලයක් භාවිතා කිරීම

41) එළදෙනකගේ කිරි අස්වැන්න සඳහා බලපාන ප්‍රධාන සාධකයක් අඩංගු නොවන පිළිතුර තෝරන්න,

(1) සත්ව විශේෂය හා සත්ව වර්ගය (2) දෙනු ලබන ආහාර (3) බුරුල්ල ආශ්‍රිත රෝග
(4) කිරිදෙවීමේ ක්‍රමය (5) ක්ෂීරණ වාරය

42) වෙළෙඳපොළ ආකෘති කිහිපයක ලක්ෂණ පහත දැක්වේ.

A- භාණ්ඩ සමජාතීය වීම
B – භාණ්ඩ සඳහා ආදේශන නොමැති වීම
C- නිෂ්පාදකයින් හෙවත් සැපයුම් කරුවන් රාශියක් සිටීම
D – වෙළෙඳපොළ ප්‍රවේශයට බාධා පැවතීම
E- අධික ප්‍රචාරණයක් පැවැතීම

ඉහත ලක්ෂණ අතරින් පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක ලක්ෂණ අඩංගු පිළිතුර තෝරන්න.

(1) C පමණි. (2) A හා B පමණි. (3) A, C හා D පමණි. (4) A, C,හා E පමණි. (5) B, C හා E පමණි.

43) රූප සටහනේ දැක්වෙන සාමාන්‍ය පිරිවැය වක්‍ර නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.




(1). සාමාන්‍ය විචල්‍ය පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැය හා ආන්තික පිරිවැය
(2). සාමාන්‍ය ස්ථාවර පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය
(3). සාමාන්‍ය මුළු පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය ස්ථාවර පිරිවැය
(4). සාමාන්‍ය ස්ථාවර පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැය හා ආන්තික පිරිවැය
(5). ආන්තික පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය ස්ථාවර පිරිවැය

44) බිත්තරවල වල ඉල්ලුම් වක්‍රය P= 210-4Qd වන අතර එහි P යනු මිල (රු/කි ග්‍රෑ) හා Qd යනු ඉල්ලුම් කළ ප්‍රමාණය බිත්තර මිලියන වේ. සැපයුම් වක්‍රය P=3Qs වන අතර එහි Qs යනු සැපයුම් ප්‍රමාණය බිත්තර මිලියන වේ. බිත්තරවල වල සමතුලිත මිල වනුයේ,

(1) රු: 30.00 (2) රු: 50.00 (3) රු: 60.00 (4). රු: 40.00 (5) රු: 60.00

45) වියළි ගොවිතැනේ දී ජල සංරක්ෂණය සඳහා භාවිතා කරන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A- පස වසුන් කිරීම
B – කාබනික ද්‍රව්‍ය පසට එකතුකිරීම
C- හැකිතරම් දුරට ක්ෂේත්‍රය රළුව පවත්වා ගැනීම
D - යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය
E- වල් පැළෑටි ආවරණ භෝග ලෙස බෝග අතරතුර වැවෙන්නට ඉඩතැබීම

ඉහත ක්‍රියා මාර්ග අතරින් ජල සංරක්ෂණ ක්‍රම අඩංගු පිළිතුර තෝරන්න.

(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) A, B හා D පමණි. (4) B, C,හා E පමණි. (5) A, B, C හා E පමණි.

46) පහත දැක්වෙන්නේ බෝග වගා ක්ෂේත්‍රයක අනුයාත කන්න 4 කදී වගාරටාවන් යොදාගෙන ඇති ආකාරයයි




A. රනිල බෝග B. ධාන්‍ය බෝග C. අල බෝග D. පලා වර්ග

මෙම වගා රටාව වනුයේ,

(1) අතුරු බෝග වගාව (2) මිශ්‍ර බෝග වගාව (3) කඩින් කඩ වගාව
(4) සත්ව බෝග වගාව (5) ශෂ්‍ය මාරුව

47) කාබනික ගොවිතැනෙහි අරමුණු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A – පස සජීවීව පවත්වා ගැනීම B – පාංශු සෞඛ්‍යය ආරක්ෂා කිරීම

C – කාබනික යෙදවුම් භාවිතා කිරීම

මින් නිවැරදි වගන්තිය/වගන්ති වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

48) කෘෂි රසායනික ද්‍රව්‍ය ආකාර 3ට ශරීර ගතවේ. එම ආකාර පැහැදිලිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ආශ්වාසයෙන්, සම හරහා, ආහාර සමග
(2) ආශ්වාසයෙන්, ආහාර සමග, පානය කිරීමෙන්
(3) ආශ්වාසයෙන්, ආහාර සමග, උපකරණ වලින්
(4) ආශ්වාසයෙන්, පානය කිරීමෙන්, ජෛව සංචලනය මගින්
(5) ආශ්වාසයෙන්, ජෛව සංචලනය මගින්, සම හරහා

49) අධික සූර්යාලෝකය යටතේ වැඩ කිරීමේදී ගොවීන්ට ඇතිවන ගැටළු කිහිපයක් පහත දැක්වේ.

A. සමහෙි කුෂ්ඨ ඇති වේ. B. කලාන්තය ඇති වේ.

C. ආසාත්මිකතා වැඩිවේ.

ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි. (5) A, B, හා C සියල්ලම.

50) කෘෂිකර්මාන්තයේ දී ඉවක් බවක් නැතිව පළිබෝධ නාශක භාවිතයෙන් සිදුවිය හැකි හානි කිහිපයක් පහත දැක්වේ.

A- මිනිස් සෞඛ්‍යයට බලපෑම් ඇතිවේ.

B- පළිබෝධ ප්‍රතිරෝධීතාව ඇතිවීම නිසා ආර්ථික හානි සිදුවේ.

C- පරිසරයට එකතුවීම නිසා පරාග කාරක මී මැස්සන් මියයාම සිදුවේ.

ඉහත කරුණු වලින් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 13 |

# අවසාන වාර පරීක්ෂණය - 2024

## කෘෂි විද්‍යාව 08 S II කොටස

පාසලේ නම : ....................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැ 03යි විනාඩි 10යි

**උපදෙස්:-** 1 - සනක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.

2 - මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය. පිළිතුරු සැපයීමට නියමිත කාලය පැය 03 විනාඩි10 කි.

''A'' කොටස ව්‍යුහගත රචනා - සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. කෙටි පිළිතුරු සපයන්න.

''B'' කොටස රචනා - ප්‍රශ්න 6 කින් සමන්විතය. ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.

### ''A'' කොටස ව්‍යුහගත රචනා

**01.** (A) (i) a. ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායක වන ව්‍යාප්ත සේවයට සම්බන්ධ රාජ්‍ය ආයතන දෙකක් සඳහන් කරන්න.

1. .......................................................................... 2 ..........................................................................

b. එම එක් එක් රාජ්‍ය ආයතනය මගින් ඉටුවන සේවාව බැගින් පිළිවෙලින් සඳහන් කරන්න.

1........................................................................................................................................................

2........................................................................................................................................................

(ii) අතීත රජරට වාරි කර්මාන්තය සුවිශේෂී වීමට උදාහරණ තුනක් සඳහන් කරන්න.

1........................................................................................................................................................

2........................................................................................................................................................

3........................................................................................................................................................

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බහුකාර්ය යෝජනා ක්‍රමවල අරමුණු දෙකක් සඳහන් කරන්න.

1........................................................................................................................................................

2........................................................................................................................................................

(B) (i) a- උපකරණය නම් කරන්න.




..............................................................................................

b- කොටස් 4 නම් කරන්න. එක් එක් කොටසින් ඉටුවන කාර්යයද සඳහන් කරන්න.

| කොටස | කාර්යය |
| --- | --- |
| A..................................................... | .......................................................................... |
| B..................................................... | .......................................................................... |
| C..................................................... | .......................................................................... |
| D..................................................... | .......................................................................... |

(ii) අධික වර්ෂාපතනය නිසා භෝග කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

1........................................................................................................................................................

2........................................................................................................................................................

(C) (i) a- පසක අඩංගු ප්‍රධාන සංඝටක හතර කවරේ ද?

1.......................................................................... 2..........................................................................

3.......................................................................... 4..........................................................................

b- ඉහත සංඝටක 4හි ප්‍රතිශත පිළිවෙලින් සඳහන් කරන්න.

1.....................................2.....................................3.....................................4.....................................

(ii) පාංශු ව්‍යුහය විනාශ වී යා හැකි ක්‍රියාකාරකම් දෙකක් පෙන්වන්න.

1..........................................................................................................................................

2..........................................................................................................................................

(iv) රතු දුඹුරු පසෙහි භෝග වගාවට පවතින හිතකර ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1..........................................................................................................................................

2..........................................................................................................................................

(D)(i) a- නයිට්‍රජන් සහ සල්ෆර් ඌනතාවය අතර ප්‍රධාන වෙනස්කම සඳහන් කරන්න.

..........................................................................................................................................

b- එම පෝෂක ඌන වූ විට දක්නට ලැබෙන ඌණතා ලක්ෂණය බැගින් ලියන්න.

N ..........................................................................................................................................

S ..........................................................................................................................................

(ii) බෝගයක පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 2ක් කෙටියෙන් විස්තර කරන්න.

1..........................................................................................................................................

2..........................................................................................................................................

(E) (i) මූලක බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙකත් එහිදී ඉටුකරන ක්‍රියාවත් කෙටියෙන් සඳහන් කරන්න.

පියවර ඉටු කරන ක්‍රියාවලිය

1.................................................... ..........................................................................

..........................................................................

2.................................................... ..........................................................................

..........................................................................

(ii) පැළ මගින් භෝග සංස්ථානයේ වාසි තුනක් සඳහන් කරන්න.

1..........................................................................................................................................

2..........................................................................................................................................

3..........................................................................................................................................

**02.** (A)(i) පසක ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ හා ස්ථිර මැලවීමේ අංකයේදී ජල ප්‍රතිශත 30% හා 12% වේ. දෘෂ්‍ය ඝනත්වය $1.2gcm^{-3}$ වේ.

a- මූල කලාපයේ ගැඹුර 20cm වන භෝගයක කළමණාකරණ අනුමත හායන ජල සම්පාදන මට්ටම 50% නම් ජල සම්පාදන අවශ්‍යතාව උසක් ලෙස සොයන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

b- භූමියේ වර්ගඵලය හෙක්ටයාර 1ක් නම් අවශ්‍ය ජල පරිමාව ඝනමීටර් වලින් සොයන්න.

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

(ii) බිංදු ජල සම්පාදන පද්ධතියක අත්‍යාවශ්‍ය කොටස් 4ක් නම් කරන්න.

1..........................................................................2..........................................................................

3..........................................................................4..........................................................................

(B) (i) a- ශාක උත්ස්වේදන ක්‍රියාවලියට බලපාන බාහිර සාධක දෙකක් සඳහන් කරන්න.

1..........................................................................2..........................................................................

b- ශාක වල උත්ස්වේදනයේ ඇති අවාසි 2ක් සඳහන් කරන්න.

1..........................................................................................................................................................................

2..........................................................................................................................................................................

(ii) පහත කාර්යය සඳහා වැදගත්වන හෝර්මෝන දෙක බැගින් සඳහන් කරන්න.

a- බීජ සුප්තතාව නැති කිරීම

1..........................................................................2..........................................................................

b- ශාක මුල් වර්ධනය උත්තේජනය කිරීම

1..........................................................................2..........................................................................

(C) (i) a- බීජ තොගයක් ජීව්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රම දෙකක් යෝජනා කරන්න.

1..........................................................................2..........................................................................

b- බීජ ජීව්‍යතාවට බලපාන ප්‍රධාන බාහිර සාධක දෙකක් ලැයිස්තු ගත කරන්න.

1..........................................................................2..........................................................................

c- ප්‍රධාන බීජ සුප්තතා ආකාර දෙකක් නම් කරන්න.

1..........................................................................2..........................................................................

(ii) බද්ධ අසංගතභාවය හඳුනාගන්නා ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1..........................................................................................................................................................................

2..........................................................................................................................................................................

(iii) a- ක්ෂුද්‍ර ප්‍රචාරණයේ වාසි දෙකක් සඳහන් කරන්න.

1..........................................................................................................................................................................

2..........................................................................................................................................................................

b- ක්ෂුද්‍ර ප්‍රචාරනයේදී යොදා ගන්නා පෝෂක මාධ්‍යයක අඩංගු විය යුතු අත්‍යාවශ්‍ය සංඝටක 3ක් සඳහන් කරන්න.

1..........................................................................3..........................................................................

2..........................................................................

(D) (i) ජාන සම්පත් සංරක්ෂණය කරන ක්‍රම 2ක සඳහන් කරන්න.

1..........................................................................2..........................................................................

(ii) පහත දැක්වෙන්නේ ශාක අභිජනනය පිළිබඳව ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ සත්‍ය නම් (√) හා අසත්‍ය නම් (X) ලකුණද දී ඇති වරහන තුළ යොදන්න.

1. විකෘති අභිජනනයට දරුණු බැක්ටීරියා යොදවා ගනී. (..........................)

2. ජෛව තාක්ෂණයේ අමුද්‍රව්‍ය ලෙස ජාන භාවිතා වේ. (..........................)

3. ස්වාධීන සංචරනය සමහර ජාන වල දැකිය නොහැකිය. (..........................)

4. කොල්චිසීන් විකෘති අභිජනනයට යොදන විකෘති කාරක රසායනිකයකි. (..........................)

**03.** (A) (i) පාලිත තත්ව යටතේ භෝග වගාවේදී භාවිතා වන පහත වචන පැහැදිළි කරන්න

1.ජල සංරක්ෂක ප්‍රචාරක ව්‍යුහ. ..............................................................................................................

..............................................................................................................

2. දැල් නිවාස. ..............................................................................................................

..............................................................................................................

3. ඒකීය සූර්ය ප්‍රචාරක ..............................................................................................................

..............................................................................................................

(ii) නිර්පාංශු වගාවේ වගා මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

1..............................................................................................................................

2..............................................................................................................................

3..............................................................................................................................

(B) (i) යම් පලිබෝධකයෙක් හඳුනා ගැනීමට භාවිතා වන ගහන මට්ටම් තුන කෙටියෙන් පැහැදිළි කරන්න.

1..............................................................................................................................

..............................................................................................................................

2..............................................................................................................................

..............................................................................................................................

3..............................................................................................................................

..............................................................................................................................

(ii) වල් පැළෑටි රූපාකාරය අනුව වර්ග කර දක්වන්න.

1...........................................................3...........................................................

2...........................................................

(iii) දිලීර රෝග වල ප්‍රධාන රෝග ලක්ෂණ 3ක් සඳහන් කරන්න.

1..............................................................................................................................

2..............................................................................................................................

3..............................................................................................................................

(C) (i) පසු අස්වනු හානි සඳහා හේතුවන පෙර අස්වනු ක්‍රියා දෙකක් සඳහන් කරන්න.

1..............................................................................................................................

2..............................................................................................................................

(ii) අස්වනුවල පරිනත දර්ශක නිර්ණයට භාවිතා කරන උපකරණ 4ක් සඳහන් කරන්න. නිර්ණය කරන දර්ශකයද සඳහන් කරන්න.

1..............................................................................................................................

2.......................................................................................................................................................................................

3.......................................................................................................................................................................................

4.......................................................................................................................................................................................

(D) මානව පෝෂණයේදී වැදගත් පෝෂක කාණ්ඩ සඳහන් කර, එම පෝෂක ලබාගත හැකි ආහාර දෙකක් බැගින් සඳහන් කරන්න.

1.......................................................................................................................................................................................

2.......................................................................................................................................................................................

3.......................................................................................................................................................................................

4.......................................................................................................................................................................................

5.......................................................................................................................................................................................

(E) (i) කෘෂි තර්මය ආශ්‍රිත මානසික ගැටළු ඇතිවීමට හේතු දෙකක් සඳහන් කරන්න.

1.......................................................................................................................................................................................

2.......................................................................................................................................................................................

(ii) එම හේතු වලට විසඳුම් දෙකක් ද යෝජනා කරන්න.

1.......................................................................................................................................................................................

2.......................................................................................................................................................................................

**04.** (A) (i) a- රැක්කවීමට සුදුසු කිකිළි බිත්තරයක බාහිර ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1.......................................................................................................................................................................................

2.......................................................................................................................................................................................

b- රැක්කවීමට සුදුසු කිකිළි බිත්තරයක අභ්‍යන්තර ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1.......................................................................................................................................................................................

2.......................................................................................................................................................................................

c- කිකිළි බිත්තරයක බීජෞෂණ කාලය සඳහන් කරන්න. ......................................................................................

d- බිත්තර රක්කවන ආකාර දෙක සඳහන් කරන්න. එම වර්ග දෙක අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

| | |
|---|---|
| රක්කවනය...................................................................... | රක්කවනය...................................................................... |
| 1.................................................................................... | 1.................................................................................... |
| 2.................................................................................... | 2.................................................................................... |

(B) (i) ගවයාගේ සංකීර්ණ ආමාශයේ කොටස් හතර නම් කරන්න.

| | |
|---|---|
| 1.................................................................................... | 3.................................................................................... |
| 2.................................................................................... | 4.................................................................................... |

(ii) එම කොටස් අතරින් ක්ෂුද්‍ර ජීවී ජීර්ණයට දායක වන කොටස/ කොටස් කරන්න.

.......................................................................................................................................................................................

(iii) ගවයින්ට ඇතිවන බඩපිපුම රෝගී තත්වයට ප්‍රධාන හේතුවක් සඳහන් කරන්න.

.......................................................................................................................................................................................

(iv) ගවයින්ට ඇතිවන බඩපිපුම රෝගය යථා තත්වයට පත් කිරීමට ගතහැකි ප්‍රතිකර්මයක් සඳහන් කරන්න.

..........................................................................................................................................................

(C) (i) නිවැරදි වචනය යොදා ගනිමින් හිස්තැන් පුරවන්න.

1. බිත්තර සඳහා දෙමුහුන් කුකුළු දර්ශ ඇති කිරීමෙන් ඉහළ නිෂ්පාදනයක් ලබා ගැනීමට සුදුසුම උෂ්ණත්ව පරාසය ........................................................ වන අතර සාපේක්ෂ ආර්ද්‍රතාව ........................................................ කි.

2. සත්ත්ව අභිජනනකරුවන් සඳහා එකිනෙකට වෙනස් විකල්ප ක්‍රියාමාර්ග ලෙස අ. ........................................................, ආ. ........................................................, ඇ. ........................................................, 3 ක් අනුගමනය කළ හැකි ය.

3. අ. ........................................................, ආ. ........................................................, ඇ. ........................................................, වැනි විවිධ අවශ්‍යතා සඳහා සත්ත්ව ආහාර සලාක වලට ආකලන එකතු කරනු ලබයි.

4. කුකුළන්ගේ පැටව් අවධිය සති ........................................................ දක්වා කාලයත්, වර්ධක අවධිය සති ........................................................ දක්වා කාලයත්, බිත්තර අවධිය සති ........................................................සිට ඉදිරි කාලයත් ලෙස ජීවිත කාලය වෙන් කරනු ලැබේ.

(D) (i) කිරි ගවයින් සම්බන්ධ පහත වචන පැහැදිලි කරන්න.

1. කිරි නිෂ්පාදනය

..........................................................................................................................................................

..........................................................................................................................................................

2. කිරි එරීම

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ii) කිරි නිෂ්පාදනයට හා එරීමට වැදගත්වන හෝර්මෝන දෙකක් සඳහන් කරන්න.

1. කිරි නිෂ්පාදනය........................................................2. කිරි එරීම ........................................................

(E) (i) පහත දැක්වෙන නිෂ්පාදන සාධකවල සුවිශේෂී ලක්ෂණ දෙක බැගින් සඳහන් කරන්න.

a. ශ්‍රමය

1..........................................................................................................................................................

2..........................................................................................................................................................

b. භූමිය

1..........................................................................................................................................................

2..........................................................................................................................................................

(ii) කෘෂි කාර්මික නිෂ්පාදන සම්බන්ධතාවයන් නියෝජනය ආකාර තුන සහ එම සම්බන්ධතා පැහැදිලි කිරීමට භාවිතා කරන වක්‍ර තුන සඳහන් කරන්න.

| නිෂ්පාදන සම්බන්ධතාවය | වක්‍රය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

## B කොටස - රචනා

**5.** (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනයට බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රම දායකවී ඇති ආකාරය විස්තර කරන්න.

(ii) බෝග නිෂ්පාදනයේ දී තුලිත පොහොර භාවිතයේ වැදගත්කම සඳහන් කරන්න.

(iii) බෑවුම් සහිත කෘෂිකාර්මික ඉඩම් සඳහා යෝග්‍ය පාංශු සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.

**6.** (i) අතුරු භෝග වගාවේ වාසි අවාසි පැහැදිලි කරන්න.

(ii) උප පෘෂ්ඨීය ජල වහන ක්‍රම විස්තර කරන්න.

(iii) සුළඟ බෝග කෙරෙහි ඇති කරන බලපෑම් පැහැදිලි කරන්න.

7. (i) කෘමි නාශක භාවිතා කිරීමේ වාසි අවාසි පැහැදිලි කරන්න.

(ii) ආහාර පරිරක්ෂණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) ලැත් නිවාස පාලිත කෘෂි කර්මාන්තයේදී යොදාගත හැකි අවස්ථා උදාහරණ සමඟ කෙටියෙන් විස්තර කරන්න.

8. (i) දේශගුණික විපර්යාස කෘෂි කර්මාන්තය කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

(ii) බෝග වගාවේදී යොදාගන්නා තවාන් වර්ග කෙටියෙන් විස්තර කරන්න.

(iii) අතු බැඳීමේ වාසි හා අවාසි පෙන්වා දෙන්න.

9. (i) පළතුරු සහ එළවළු වල පසු අස්වනු හානි අවම කිරීමට යොදාගන්නා ක්‍රම විස්තර කරන්න.

(ii) බිත්තර සඳහා ඇති කරන කිකිළියන් පිටලෑම සිදුකරන අවස්ථා විස්තර කරන්න.

(iii) කෘෂි කාර්මික නිෂ්පාදනවල අගය දාම ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

10. (i) සමෝධානික වල් පැළෑටි පාලනය විස්තර කරන්න.

(ii) ගව දෙනක් ගැබ්ගත් පසු රැක බලා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(iii) පූර්ණ තරගකාරී වෙළෙඳපොළක සමතුලිතතාවය ඇතිවන ආකාරය වක්‍ර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. එවැනි වෙළෙඳපොළක ලක්ෂණ දක්වන්න.

A/L

ARTS



Search on Telegram - උසස් පෙළ කලා